**ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලා වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 26 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූලා හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 286.22 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 134.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 152.01 ක් හෙවත් සියයට 53.11 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 109.82 | 98.66 | 11.16 | 10.12 |
| මූලධන | 176.40 | 35.54 | 140.86 | 79.85 |
| **එකතුව** | **286.22** | **134.20** | **152.02** | **53.11** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20901 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 5.60 | 3.15 | 3.00 | 3.37 | 26.00 | 13.38 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 1.02 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 343,339 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිග හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.2 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය**

**3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කර තිබුණද, නව ගොඩනැගිල්ල සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 130 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම මිලදී ගැනිමට අදාළ ප්‍රසම්පාදන කටයුතු මෙම සැලසුමට ඇතුළත් කර නොතිබුණි.

**3.2.2 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

**3.2.3 විගණන හා කළමනාකරණ කමිටුව**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

2012 නොවැම්බර් මාසයේදී විවෘත කර තිබුණු නව ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 638 ක් වැයකර තිබුණි. එම විවෘත කිරීමෙන් වර්ෂ 3 ක් ඉක්ම ගියද, ගොඩනැගිල්ලට අවශ්‍ය උපකරණ හා චලනය කළ හැකි රාක්ක ( **MOBILE RACKING SYSTEM)** සපයාගෙන නොතිබීම නිසා 2016 ජුනි 30 දින වන විටත් ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි.

**3.4 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් 2013 සැප්තැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සංදේශයට ලබාදෙන ලද නිර්දේශයන් මත ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීමට සංවිධාන ව්‍යුහය, තනතුරු හා සේවක සංඛ්‍යා අවශ්‍යතා හඳුනාගෙන තිබුණ ද, 2016 ජුනි මාසය වන විටත් අදාළ උත්ශ්‍රේණිගත ක්‍රියාවලිය අවසන්ව නොතිබුණි.

**(ආ) චලනය කළ හැකි රාක්ක මිලදී ගැනීම ( MOBILE RACKING SYSTEM)**

නව ගොඩනැගිලි පරිශ්‍රයේ විවිධ අංශ සඳහා ලී බඩු උපකරණ අයිතම 285 ක්, පරිගණක අයිතම 185 ක් සහ චලනය කළ හැකි රාක්ක මිලදී ගැනීම සඳහා උපදේශාත්මක සේවා ලබා ගැනීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත පවරා තිබුණි. අදාළ උපදේශන සේවා ගාස්තුවෙන් සියයට 50 ක් වූ රු. මිලියන 12.5 ක් 2014 ජූලි 04 දින ගෙවා තිබුණි. නමුත් 2015 වර්ෂය සඳහා චලනය කළ හැකි රාක්ක මිලදී ගැනීමට සළසා තිබු රු.මිලියන 130 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිවී තිබුණි.

**(ඇ) අධිලේඛන වෙළුම් සංරක්ෂණය හා සූක්ෂම ඡායාගත කිරීම**

සමාලෝචිත වර්ෂයේදී සංරක්ෂණය කිරීමට අපේක්ෂිත අධි ලේඛන වෙළුම් සංඛ්‍යාව 36 ක් වුවත්, වෙළුම් 13 ක් පමණක් සංරක්ෂණය කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී සූක්ෂම ඡායාගත කිරීමට අපේක්ෂිත අනාවරණ සංඛ්‍යාව 155,000 ක් වුවත්, වර්ෂය තුළ අනාවරණ 133,483 ක් පමණක් සූක්ෂම ඡායාගත කර තිබුණි.

## 3.5 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ව්‍යාපෘති ආරම්භ නොකිරීම**

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|
| | රු. | |
| චිත්‍රපට ඩිජිටල්කරණය කිරීම | 6,000,000 | පුහුණු නිලධාරීන්ගේ හිඟය |
| සිතියම් ඩිජිටල්කරණය කිරීම හා ප්‍රසිද්ධ කිරීම | 2,500,000 | පුහුණු නිලධාරීන්ගේ හිඟය |
| එකතුව | 8,500,000 | |

## 3.6 බැංකු ගිණුම්

**ගැලපුම් කළ යුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල සඳහන් එකතුව රු. 823,057 ක් වූ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ චෙක්පත් 04 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අළුතින් ආරම්භ කිරීමට නියමිත රත්නපුර ශාඛා කාර්යාලයට අවශ්‍ය වානේ රාක්ක මිලදී ගැනීම සඳහා 2015 දෙසැම්බර් මාසයේ දී රු. මිලියන 2.72 ක් වැය කර තිබුණ ද, 2016 ජූනි මාසය වන විටත් ඒ සඳහා සුදුසු ගොඩනැගිල්ලක් සපයාගෙන නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 02 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 41 | 09 | 32 |
| (iii) | ද්විතියික මට්ටම | 133 | 53 | 80 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 55 | 19 |
| | එකතුව | 254 | 119 | 135 |

**(ආ) කාර්ය මණ්ඩල ඌනතාවය මත කාර්යසාධනය පහත වැටීම.**

වසර 07 කට වැඩි කාලයක සිට වර්ධනය වෙමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අධිලේඛන වෙළුම් සංරක්ෂණය**

2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ සංරක්ෂණය කළ යුතු අධිලේඛන වෙළුම් සංඛ්‍යාවෙන් සියයට 16 ක සිට සියයට 72 දක්වා පරාසයක ප්‍රමාණයකින් පමණක් සංරක්ෂණය කර තිබුණි.

(ii) සංරක්ෂණය කළ යුතු ලේඛන ප්‍රමාණය

දෙපාර්තමේන්තුවේ කෝෂ්ඨාගාර 5 ක හා රහස්‍ය ලේඛන අංශය සතුව සංරක්ෂණය කළ යුතු කඩදාසි ලේඛන පිටු සංඛ්‍යාව 2016 මාර්තු මාසය වන විට 79,372,200 ක් වී තිබුණි. තැටි, වර්ණ ප්‍රතිමූර්ති (Slides), චිත්‍රපට හා රූපවාහිනී පට ඇතුළු කෝෂ්ඨාගාරවල තැන්පත් ශ්‍රව්‍ය දෘෂ්‍ය ලේඛන සංඛ්‍යාව 13,957 ක්ද, ඡායාරූප 281,910 ක් ද විය. දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 254 ක් වී තිබුණත් තථ්‍ය සේවක සංඛ්‍යාව 119 ක් වී තිබුණි. පුරප්පාඩු ප්‍රතිශතය සියයට 52 ක් පැවතියදී ඉහත ලේඛන සංරක්ෂණය හා සුරක්ෂිතභාවය මැනවින් ඉටු කර නොතිබුණි.